# No more Excuses ( Sam J - 9th Dec18)

## තවදුරටත් නිදහසට කාරණා කීමක් නැත

දෙවියන්වහන්සේට පක්ෂපාත වීම, ස්වාමින්වහන්සේට තදින් ඇලී සිටීම, යාච්ඤා කිරීම, දේව වචනය කියවීම සහ එකිනෙකා සමග සහභාගිකම පැවැත්වීම වැනි සමහර යහපත් දේවල් ගැන මුරණ්ඩුවීම හොඳ බව අපි පසුගිය සතියේ ඇසුවෙමු.( ඊට කලින් - අත්නොහැරීම)

අද දෙවියන්වහන්සේ ගැන සහ උන්වහන්සේට සේවය කිරීමට එන විට නිදහසට කාරණා කීමක් නැත යන විෂය ගැන කතාකරන්නට මට අවශ්‍යයි.

අද අපි ජීවත් වෙන්නේ නිදහසට කරුණු කීමේ සංස්කෘතියකට හැඩ ගැසී වර්ධනය වූ සමාජයකය. අපට යම්කිසි දෙයක් කරන්නට හෝ යම්කිසි ස්ථානයක සිටින්නට කියන විට කණගාටුදායක ලෙස බොහෝවිට බොහෝ දේවලදී අපගේ ක්ෂණික ප්‍රතිචාරය වෙන්නේ "මට වෙලාවක් නැහැ නැත්නම් මට හරියට වැඩ තියෙනවා". මෙය සභාවද ආක්‍රමණය කර ඇත. යමක් සඳහා අපව අවශ්‍යවන විට මාත් ඇතුලුව අප බොහෝ දෙනෙක් පුරුදුවී සිටින්නේ නිදහසට කාරණාවක් කීමටය.

මට මේ වටිනා කියමන දකින්න ලැබුණා. "නිදහසට කාරණා කීමට ඔබේ ශක්තිය නාස්තිකරන තාක් කල් ඔබට දියුණුවක් ලබා ගත නොහැක."

මෙන්න සිතන්නට දෙයක්. වැදගත් නොවන නමුත් මේ ජීවිතයට අවශ්‍යයි කියා සිතන දේවල් පසුපස හඹා යාම සඳහා වැදගත් හෝ ප්‍රතිලාබ ලැබිය හැකිව තිබුණු යම් දේවල් නොකර, ඒවා ගැන අප කොපමණ වරක් නිදහසට කරුණු කියා තිබෙනවාද?

නායකයෙක් හෝ සභාපාලකයෙක් ලෙස මිනිසුන් හවුල් කරගෙන ඔවුන්ට ඊළඟ තලයට යාමට උදව්කිරීමට වෑයම් කරන විට සෑම ආකාරයේම නිදහසට කාරණා ඔබට ඇසෙනවා.

ඔවුන් දැක්කත් ඇසුනත් සහ ඔවුන් තුළ පසුතැවිල්ලක් ඇතිවුනත් මිනිස්සු යේසුස්වහන්සේ වෙතට ඒම නොකරන්නට? නිදහසට කරුණු කියනවා අපට කොයිතරම් ඇසී තිබෙනවාද?

සභාවට එන්නට සහ දෙවියන්වහන්සේගේ මිනිස්සුන් සමග සහභාගිකම් පැවැත්වීමට නිදහසට කරුණු කියනවා අපට කොයිතරම් ඇසී තිබෙනවාද?

මට බොහොම වැඩ වැඩියි (සභාවට එන්නට), මට ඕනෑ දේවල් කරන්නට නොවේ, නැත්නම් මට වෙලාව නැහැ. ඒත් සාදවලට සහ වෙනත් දේවල්වලට වෙලාව තියෙනවා. වැනි නිදහසට කරුණු මිනිස්සු කියනවා අපට කොයිතරම් ඇසී තිබෙනවාද?

*මතෙව් 6:21 - ඔබේ වස්තුව කොතැනද ඔබේ සිතත් එතැනම වන්නේය.*

මේ වාගේ උදාහරණ: මගේ දරුවන්ට වේලාසනින් නිදා ගන්ට ඕනෑ, ඒනිසා මට එන්නට බැහැ. නැත්නම් ඔවුන්ට ඉරිදාට යම් දෙයක් කරන්ට තියෙනවා, වැනි නිදහසට කාරණා. දෙමාපියන් ඉරිදා උදේට දරුවන් කරාටේ සහ වෙනත් ක්‍රියාකාරකම් වලට ගෙන යන හැටි මම දැකලා තියෙනවා. අපූරු වැඩේ නම් දරුවෝ ඒ දේවල්වලට උදේම නැගිටිනවා.

මෙවැනි උදාහරණ: මේ සතිය මට වැඩ අධික වුන නිසා අපි ඉරිදාට විවේක ගන්ට ඕනෑ.

සමහරු කරදරවෙන්ට බැරි තරම් කාර්යය බහුලයි.

සමහරු එන්නට බැරි තරම් ආඩම්බරයි. සමහරු එන්නට බැරි තරම් තමන් ගැනම සෑහීමට පත්ව සිටිති, මට සෑමදෙයක්ම තියෙනවා, ඒනිසා මට දෙවියන්වහන්සේවත් සභාවවත් අවශ්‍යවෙන්නේ නැහැ. නිදහසට කාරණා එකකට පසුව එකක්.

යේසුස්වහන්සේටත් උන්වහන්සේගේ දවස්වලත් මේවාගේම තිබුණා. මංගල කෑමකට එන්නට තිබුණු වෙලාවේ විශේෂ ආරාධිත අමුත්තන් විසින් නිදහසට කාරණා දෙන්නට පටන් ගත් හැටි ගැන, උන්වහන්සේ ලස්සණ කතන්දරයක් කියනවා: ලූක් 14:16-24

එහි නිදහසට කාරණා වර්ග 3ක් ඇත:

1 ව්‍යාපාරිකයාගේ නිදහසට කාරණාව- මම ඉඩම් කෑල්ලක් මිලට ගත්තා, එනිසා මම ගිහිල්ලා ඒක පරීක්ෂා කර බැලිය යුතුයි. ඔහු කළ දෙයෙහි කිසි වරදක් නැහැ. නමුත් රජු විසින් දුන් විශේෂ ආරාධනාවට ප්‍රමුඛත්වය දීම අතපසු කිරීමට සහ එයට සහභාගි නොවීමට නිදහසට කරුණක් ලෙස ඔහු එය යොදාගැනීමයි වරද. මම කල්පනා කරන්නේ අපේ ජීවිත වල පළමුතැන ගන්නේ මොනවාද? කියලයි. ජීවිතයේ කාරණා හෙවත් ජීවනයේ උල්පත් අපගේ හදවත් (සිත්) වලින් ගලායන බැවින් අපගේ සිත් ආරක්ෂා කරගන්නා ලෙස බයිබලය අපට පවසයි (හිතෝපදේශ 4:23). ජීවිතයේ එම වටිනා වැදගත් දේවල් අපේ අභ්‍යන්තරයෙන්ම පිටතට ගලා එන්නේය.

අපගේ සිතදෙවියන්වහන්සේගේ දේවල්වලින් පිරී තිබෙන විට අපි ප්‍රඥාවන්තව තෝරා ගන්නෙමු, රජුගේ මංගල භෝජනයට නොයන පිණිස නිදහසට කිසි හේතුවක් නොදක්වනවා ඇත.

රජුගේ මංගල භෝජනයට මිනිස්සු රැස්වෙන ස්ථානය නම් සභාවයි. දෙවියන්වහන්සේට නමස්කාර කරන පිණිස එක්සිත්ව මිනිසුන් කණ්ඩායමක් රැස්වෙන ස්ථානය, කූඩාරම් මණ්ඩපය මෙයයි. රජුගේ මේසයෙහි අපට නියම තැන අපි සිටින විට අපට රජතුමාගේ ප්‍රතිලාභ සහ ආගන්තුක සත්කාරය ලැබෙන අතර ඒවා භුක්ති විඳින්නට ලැබේ. දාවිත් රජු මෙසේ කීවේය: ගීතාවලිය 84:10 දේවමාලිගාවේ ගතකරන එක් දවසක් වෙනත් තැනක ගතකරන දවස් දහස්ගණනකට වඩා යහපත්ය! දුෂ්ඨකමේ මාලිගාවල වාසය කරනවාට වඩා මාගේ දෙවියන්වහන්සේගේ ගෘහයෙහි දොරටුපාලයෙක් වෙන්නෙමි.

බදාදා කණ්ඩායම් එකතුව රජුන් උදෙසා රැස්වීමකි. අපගේ දෙවියන්වහන්- සේට කරන ප්‍රශංසා සහ නමස්කාරය සහිත පසුබිමක අප සිටින විට දෙවියන්වහන්සේගේ වැඩවසන අභිමුඛය නිසා යහපත්කමේ සහ සම්පූර්ණකමේ ප්‍රතිලාභ මෙන්ම අපේ අවශ්‍යතාවයන්ද අපට ලැබෙනවා ඇත.

2 වැඩ කරන මිනිසාගේ නිදහසට කාරණාව- මංගල භෝජනයට රජුගෙන් ලැබෙන ආරාධනාවට වඩා වැඩියෙන් මගේ වැඩය වැදගත්. මා මිලට ගත් අලුත් හරක් සමග කුඹුර හාන්නට තියෙනවා කියමින් ඔහු නිදහසට කරුණු කීවේය. මට මේ සත්තු පරීක්ෂා කරන්නට තියෙනවා. රැකියාවක් තිබීම, වැඩට යාම, ඉතාමත්ම වැදගත් ඒත් ඔබේ වැඩය දෙවියන්වහන්සේට වඩා ඉහළින් ප්‍රමුඛස්ථානය ගන්නා විට එය ප්‍රශ්නයක් සහ බාධාවට හේතුවක් බවට පත්වෙයි. සමහර අවස්ථාවලදී වැඩ මිනිස්සුන්ගේ ජීවිත අබිබවා යයි, එවිට ඔවුන්ගේ ලෝකය කරකැවෙන්නේ ඔවුන්ගේ වැඩ වටාය. එවිට වැඩ ඔවුන්ගේ දෙවියා බවට පත්වෙයි. සමහර අවස්ථාවලදී මුදල් ඔවුන්ගේ ජීවිතවල දෙවියා බවට පත්විය හැකියි.

මිනිස්සුන්ට රැකියා ලැබෙන්නට කියා අපි බොහෝවිට යාච්ඤා කරනවා. ඔවුන්ට ඒක ලැබුණාම ඔවුන් දේවගෘහය නොසළකා හරිනවා. රැකියාවට මුල්තැන දෙනවා. රැකියාව වැදගත් නමුත් එයට දෙවියන්වහන්සේට විශ්වාසවන්තව කීකරුවීම වෙනුවට තිබෙන ස්ථානය දීම කිසිම විටක නොකළ යුතුයි. ( නිදර්ශනය: සභාවේ දේවමෙහෙයන් පැවැත්වෙන වෙලාවේ වෙනත් කිසිම වැඩ සටහනකට සහභාගි වීමට ශේන්, ශෝන් හෝ ක්ලෝයි ධෛර්‍යමත් කිරීම අප විසින් කළේ නැහැ. දෙවියන්වහන්සේගේ සෙනග එකට රැස්වීම සහ නමස්කාරය වැදගත්බව ඔවුන් දැනගැනීම අපට ඕනෑවුනා.

සභාව වැදගත් බව ඔවුන් දැනගත් නිසා ඉරිදා උදේට පැවැත්වෙන උපන්දින සාද වැනි දේවලට ලැබුණු ආරාධනාවන් ඔවුන් අත්හැරියා. මගේ කලින් රැකියාවෙන් මට ඉවත්වීමට වුනාම මට මතකයි දේවස්ථානයේ සේවය කරන්නට පුලුවන්වන පිණිස, වැඩි පඩියක් ගෙවන පැය කීපයක් වැඩ කළ හැකි රැකියාවක් ලැබෙන්න කියා යාච්ඤා කළා.) සභාවට හෝ දෙවියන්- වහන්සේගේ සෙනග සමග රැස්වීමට නෑවිත් සිටීමට රැකියාව නිදහසට කාරණාවක් කර ගන්නට එපා. ඔබට ඒ සහභාගිකම, ඒ යාච්ඤා සහයෝගය සහ ඒ ධෛර්‍යයමත් කිරීම අවශ්‍යයයි. එසේම ඔබ ශුභවාදී, ඇදහිල්ලෙන් පිරුණු මිනිස්සුන් සමග ගැවසෙන විට ඔබේ අදහිල්ලත් ශක්තිමත් වෙනවා.

3 පවුලේ මිනිසාගේ නිදහසට කාරණාව- වුනේ ඔහුගේ බිරිඳයි ! විවාහවීම ඉතා හොඳයි. අපි ඒ ගැන බොහොම සතුටුවෙනවා. ඒත් ඒකට ඔබ දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සිටීම හෝ ස්වාමින්වහන්සේට නමස්කාර කිරීම සඳහා දෙවියන්වහන්සේගේ මිනිසුන් සමග එකට රැස්වීම නවත්වන්නට ඉඩ දෙන්න එපා. දෙවියන්වහන්සේ ඔබට බිරිඳක් හෝ සහකාරයෙක් දී ආශීර්වාද කර තිබෙන විට දෙවියන්වහන්සේගේ අභිමුඛයේ සිටින්නට, එකමුතුව යාච්ඤා කරන්නට, දෙවියන්වහන්සේගේ පවුලේ අය සමග එකට රැස්වෙන්නට එකිනෙකා දිරිමත් කරන්න. ඔබ ඔබව තනිකර ගත් විට ඔබේ සතුරාට ඔබව පහසුවෙන්ම ගොදුරු කර ගත හැකි වෙනවා. දේවගෘහයේ කටයුතුවලට සම්බන්ධ වන සහ දේවගෘහයේ ක්‍රියාකාරීව හවුල් වන මිනිසුන් සතුරාගේ පහර දීමට ලක්වන්නේ කලාතුරකින් බව ඔබට දැකිය හැකි වේවි. ඒ ඇයි? ඔවුන් ස්ථානගතව සිටින්නේ දෙවියන්- වහන්සේගේ අභිමුඛය පවතින සහ උන්වහන්සේගේ මිනිසුන් සිටින වාතාවරණයක නිසාය. අපි එකට එකතුවී ප්‍රශංසා කරන විට, නමස්කාර කරන විට සහ සාක්ෂි බෙදා ගන්නා විට දෙවියන්වහන්සේ මහිමයට පත්වෙයි, වචනය තුළින් සහ එකිනෙකා උදෙසා කරන යාච්ඤා තුළින් අපට ශක්තිය සහ ධෛර්‍යය ලැබෙයි. වොට්ස්ඇප් යාච්ඤාව හොඳයි. නමුත් සහෝදර ශුද්ධවන්තයන් සමග මුහුණට මුහුණලා මුණගැසීමට එය සමාන කළ නොහැකියි. මුහුණට මුහුණලා කරන කතාවකින් කෙරෙන දේ කෙටි පණිවිඩයක් යැවීමෙන් කරන්නට නොහැකිවීම වැනිය. සේවය සපයන නියෝජිතයෙකුට අප අමතන විට දුරකථනයෙන් ලැබෙන පටිගත කිරීම් වලට සවන්දීම වීම අපි කීදෙනෙකුට එපාවී තියෙනවාද !

එමනිසා ප්‍රශ්නය මෙයයි. ඔබ දෙන නිදහසට කාරණාව කුමක්ද? ඒ ව්‍යාපාරික කාරණාවක්ද? රැකියාව ගැන කාරණාවක්ද? පවුලේ කාරණාවක්ද?

මම වැඩ කරන්නේ ඉතා ලොකු සංවිධානයකට වුනත් එහි සිටින ඔවුනුත් අපේ වෙලාව සහ ජවය/ශක්තිය සමබරව තබා ගැනීමේ වැදගත්කම දන්නවා. අපට ජවය (විගණනය කිරීමක්) ශක්තිය පරීක්ෂාකර ගණන් බැලීමක් කියා දෙයක් කරන්නට තිබෙනවා. ඒ සඳහා අපේ වැඩකරන ජීවිතය සහ නිවසේ ජීවිතය සමබරව පවත්වාගන්නේ කෙසේද කියා වර්ග 4ක ප්‍රශ්න අසනවා. ඒවා නම් වශයෙන් මෙසේය. 1 ශාරීරික- (එක්කෙනෙක් පැය කීයක් නිදාගන්නවාද? කරන ව්‍යායාම මොනවාද? දවස පුරා පිළිවෙලකට නියමිත ලෙස කෙටි විවේකයන් ගන්නවාද? වැඩ සමග ඇති සම්බන්ධතාවය විසන්ධි කරන්නට වෙලාව ගන්නවාද?

2 උද්වේග- (වැඩ ගැන දක්වන උද්‍යෝගයේ මට්ටම? කිට්ටු නෑයන් මුණගැසීම උදෙසා? වැඩට පිටස්තරව විනෝදාංශ වැනි දේවල් කිරීමට?)

3 මානසික- (දවස තුළ ප්‍රමුඛ ස්ථානය ගන්නා දේවල්? කරන්නට තිබෙන දේවල් ගැන ලැයිස්තුවක් තිබෙනවාද? අපේ මනස නිශ්ශබ්ද කරගැනීමට අපි ඕනෑකමින් වෙලාවක් ගන්නවාද? )

4 ආත්මිකව-

සංවිධානය ඔබ දවස හොඳින් කලමනාකරණය කරගන්නේ කෙසේද කියා සහතික කරගැනීමට මෙපමණ උනන්දුවක් දක්වන්නේ ඇයි මෙයින් පෙනෙනවා ඇත. ඔබට ඉතා හොඳ සේවයක් ලබා දිය හැකි වන්නේ එවිට පමණයි.

දෙවියන්වහන්සේට සහ උන්වහන්සේගේ ගෘහයට වෙලාවක් වෙන්කරගැනීම ඉතාමත්ම වැදගත්ය. *<u>මතෙව් 6:31-33</u> මම මෙහිදී උත්සාහ කරන්නේ නුඹලා සැහැල්ලුවෙන් සිටින්නට සැලැස්වීමටයි, එසේ කරන්නේ නුඹලා ලබා ගැනීම ගැනම කල්පනාවෙහි යෙදී නොසිට, දෙවියන්වහන්සේගේ දීම ගැන නුඹලාට ප්‍රතිචාර දැක්වීමට හැකිවන පිණිසය. දෙවියන්වහන්සේ ගැන සහ උන්වහන්සේ වැඩකරන ආකාරය ගැන නොදන්නා මිනිස්සු මේදේවල් ගැන කිකරුණේ කලබල වෙති. නමුත් නුඹලා දෙවියන්වහන්සේ ගැන සහ උන්වහන්සේ වැඩකරන ආකාරය යන දෙකම දන්නහුය. දෙවියන්වහන්සේගේ නියම ස්වභාවය තුළ ඔබගේ ජීවිතය මුල් ඇද පවත්වා ගන්න. දෙවියන්වහන්සේ- මුල පිරීමය, දෙවියන්වහන්සේ- සැපයීමය. නැතිවෙන දේවල් ගැන කනස්සලු නොවන්න. මිනිස් ආකාරයෙන් සෑමදාම ඔබ කනස්සලු වෙන සියලුම දේවල් ඔබට ලැබෙන බව ඔබ දැනගන්නවා ඇත.*

මට අද ඔබව ධෛර්‍යමත් කරන්නට ඉඩ දෙන්න, ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට මුල් තැන දෙන විට ඔබගේ සියලුම අවශ්‍යතා ගැන බලා ගැනීමට දෙවියන්වහන්සේ බැඳී සිටිනසේක. යේසුස්වහන්සේ ඔබට ප්‍රේම කරනසේක. ඔබේ ජීවිතය වෙනුවෙන් අලංකාර සැලැස්මක් තබා ඇත. ඔබව සම්පූර්ණයෙන් තෘප්තිමත් කර ඒ හිස්ව තිබෙන තැන පිරවිය හැක්කේ යේසුස්වහන්සේට පමණයි. මක්නිසාද උන්වහන්සේ ඔබ උදෙසා කුරුසිය මත මළසේක. ඔබ උදෙසා නැවත නැගිටුනුසේක. ස්වර්ගයේ සිටින උන්වහන්සේගේ පියාණන්වහන්සේ ඉදිරියේ ඔබව පෙන්වා දෙනසේක. උන්වහන්සේගේ ප්‍රේමය ඔබව අත්හැර නොදමයි, සිඳී නොයයි. ඔබව සියල්ල තුළින් ඉදිරියට ගෙන ඒම සඳහා ඔබට යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය හැකියි.